**13 ශ්‍රේණිය ආර්ථික විද්‍යාව**

## නිපුණතා මට්ටම 10.5 - විදේශ විනිමය අනුපාතිකය තීරණය වන ආකාරය විශ්ලේෂණය කරයි.

### විදේශ විනිමය වෙළෙඳපොළ -

- විදේශ විනිමය හුවමාරු වන ආයතනික ව්‍යුහයන්ගේ සම්බන්ධතාවන් විදේශ විනිමය වෙළෙඳපොළ ලෙස හඳුන්වයි.
- විදේශ විනිමය ඉල්ලුම්කරුවන් හා සැපයුම්කරුවන් එම විදේශ විනිමය අනුපාතිකයන් හා හුවමාරු කර ගන්නා විදේශ විනිමය ප්‍රමාණයන් තීරණය කර ගැනීමට සම්බන්ධ වන ආයතනික ව්‍යුහයන් විදේශ විනිමය වෙළෙඳපොල ලෙස හැඳින්විය හැකිය.

### විදේශ විනිමය අනුපාතිකය -

දේශීය ව්‍යවහාර මුදල් ඒකකයක් විදේශ ව්‍යවහාර මුදල් ඒකක බවටත් විදේශ ව්‍යවහාර මුදල් ඒකකයක් දේශීය ව්‍යවහාර මුදල් ඒකක බවටත් පරිවර්තනය කරන අනුපාතිකය විදේශ විනිමය අනුපාතිකය නම් වේ.

### නාමික විනිමය අනුපාතිකය

මෙලෙස කිසියම් මුදල් ඒකකයක මිළ තවත් මුදල් ඒකකයකින් ප්‍රකාශ කිරීම නාමික විනිමය අනුපාතිකය නම් වේ.

**අභ්‍යාස**

1.විදේශ විනිමය වෙළෙඳපොලේ ක්‍රියාකාරී පාර්ශ්වයන් මොනවාද?

2.විදේශ විනිමය අනුපාතිකය ප්‍රකාශ කරන ක්‍රම දෙක නම් කර පැහැදිලි කරන්න.